# IX වන පරිච්ඡේදය.

## තීරණ

අධිකාර පත්‍රයේ අන්තර්ගතවූ නිර්ණේය විෂයයන් පිළිබඳ අපගේ තීරණ මෙහි පහත ලැයිස්තු කොට දක්වමු. මෙම තීරණවලට බැස තිබෙන්නේ, මෙම කොමිෂන් සභාව ඉදිරියේ තබන ලද සියළුම සාක්ෂි සහ කොමිෂන් සභාව විසින් මෙම පරීක්ෂණයේදී සලකා බලන ලද වෙනත් විශ්වාසදායක කරුණු බැරෑරුම් ලෙස සලකා බැලීමෙනි. මීට පූර්වයෙන් වූ පරිච්ඡේදවල සඳහන් කර තිබෙන්නේ මෙම තීරණවලට බැසීමේදී සැළකිල්ලට භාජනය කරන ලද ප්‍රධාන සාක්ෂිවල හා කරුණුවල සම්පිණ්ඩනයකි. මෙම තීරණ ගැනීමට හේතුවූ කාරණා ගැන සම්පූර්ණ අවබෝධයක් ලබාගැනීම සඳහා අතිගරු ඔබතුමිය පරීක්ෂණ කටයුතු වල සම්පූර්ණ වාර්තාව කාරුණිකව සලකා බැලීම සුදුසු යයි යෝජනා කරනු කැමැත්තෙමු. එම පරීක්ෂණ කටයුතු පිළිබඳ වාර්තාව මෙම වාර්තාව සමඟ ඉදිරිපත් කරනු ලැබේ.

(අ) සපුගස්කන්ද පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන 1990 පෙබරවාරි මස 20 වන දින හෝ ඊට සමීප කාලයේදී අතුරුදහන්වීමේ සිද්ධියට සම්බන්ධ කරුණු හා එම අතුරුදහන්වීමට වගකිවයුතු පුද්ගලයා හෝ පුද්ගලයින් සහ එම ක්‍රියාවට ආධාර හා අනුබල දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් ;

උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට හේතුවූ තත්ත්වයන් මෙහි ඉහත 6 හා 7 පරිච්ඡේදවල විස්තරාත්මකව සඳහන් කරන ලදී. එමනිසා එම විස්තර මෙහි නැවත ගෙනහැර දැක්වීමට අදහස් නොකරමු. එසේ වුවද, රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට සම්බන්ධ තත්ත්වයන් සමස්තයක් වශයෙන් තේරුම්ගත හැක්කේ, සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ල කරන ලද ප්‍රහාරය හා ඊට පසුව එම ප්‍රහාරය ගැන කරන ලද විමර්ෂණයන් පසුබිම් කොට ගෙන බව ප්‍රකාශ කරනු කැමැත්තෙමු. මෙම කරුණුවලට කඳුරුවගේනගේ ජිනදාස නොහොත් ජිනේ රඳවා තැබීම, විමර්ෂන පැවැත්වීම හා ඔහු අතුරුදහන්වීමත් ඇතුලත් බව සැලකියයුතුය.

සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ල කරන ලද ප්‍රහාරය සම්බන්ධ අපගේ අදහස් මෙසේය:

I. 1989 ජූලි මස 16 වන දින එළිවන යාමයේ පුද්ගලයින් කණ්ඩායමක් සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරයක් එල්ල කළේය.

II. බෝම්බයක් පිපිරීමෙන් ඇතිවූ පිපිරීමකුත් සමග සපුගස්කන්ද පොලිස් ස්ථානයට පිටතින් එල්ලවූ ප්‍රහාරය ආරම්භ විය. බෝම්බය තිබී පිපුරුණේ පොලිස් ස්ථානයේ ඉහළ මාලයේ වැසිකිළියකය.

III. ඉහත සඳහන් ප්‍රහාරයේදී ලද තුවාල නිසා සපුගස්කන්ද පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරී පොලිස් පරීක්ෂක ලලිත් මහානාම ඇතුළු පොලිස් නිලධාරීහු තිදෙනෙක් ජීවිතක්ෂයට පත්වූහ.

IV. සපුගස්කන්ද පොලිසියේ පොලිස් නිලධාරීහු විසින් ප්‍රහාරකයින්ට විරුද්ධව එල්ල කළ ප්‍රති ප්‍රහාරයේදී ලද තුවාල වලින් සුමිත් පෙරේරා නොහොත් කලුවා නමින් හැඳින්වෙන පුද්ගලයකු ඇතුළු ප්‍රහාරකයෝ දෙදෙනෙක් මරණයට පත්වූහ.

V. ඉහතින් සඳහන් සුමිත් පෙරේරා, සුනිල් පෙරේරා නොහොත් ගෝනවල සුනිල් යන පුද්ගලයාගේ බෑණා කෙනෙකි. සුමිත් පෙරේරා සහ සුනිල් පෙරේරාගේ (ඔවුහු කැලණිය ප්‍රදේශයේ අයය.) සම්පූර්ණ පවුලම එවකට පාලක පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයේ සුප්‍රසිද්ධ ක්‍රියාකාරීහු හා හිතවත්තු වූහ.

VI. ඉක්බිතිව, සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවූ ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ෂණයන් කරන ලද්දේ ඉක්මන් ස්වභාවයකින් හා මෙම අපරාධය සිදුකළ තැනැත්තන් නීතිය හමුවට පැමිණවීමේ අවංක අරමුණ ඇතිව නොවේ.

VII. ප්‍රහාරයෙන් පසු බේරී ගිය අනිකුත් ප්‍රහාරකයින්ගේ අනන්‍යතාවත් ඔප්පු කිරීමට හැකිවී නැත.

VIII. මුල් විමර්ශකයෝ සුමිත් පෙරේරා නොහොත් කලුවාගේ අනන්‍යතාව හෙළිකිරීම ඕනෑකමින්ම යටපත් කර තිබේ.

IX. මුල් විමර්ෂණය අතරතුරේදී ශාන්තලාල් නමින් හැඳින්වුනු සැකකරුවෙක් කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබුවේය. ප්‍රශ්න කිරීමට ලක්කරන ලදුව, ඔහු ඉහත සඳහන් අපරාධයට සම්බන්ධ බව පිළිගත්තේය. ඔහු පොලිස් ස්ථානයේ ඇතුළත මෙහි කලින් සඳහන් කරන ලද සුමිත් පෙරේරා නොහොත් කලුවා විසින් දෙන ලද බෝම්බයක් තැබීමෙන් ඊට සහභාගීවී යයි පිළිගත්තේය.

X. මුල් විමර්ෂකයෝ මෙම සාක්ෂිය ලබාගෙන සිටි නමුත් එය යටපත් කළ අතර, ඊට පසුව පෙරකී සැකකරු පොලිස් භාරයේ සිටියදී ඉතාමත් සැකකටයුතු තත්ත්වයන් යටතේ අතුරුදහන්විය.

XI. මුල් විමර්ෂකයෝ ශාන්තලාල්ට විරුද්ධව අපරාධ නඩුවක් පැවරීම උවමනාවෙන්ම මගහැරියහ. එසේ කරන ලද්දේ වෙනත් පුද්ගලයින් මෙම වරදට පටලැවීමට ඔවුන් තැත් කළ නිසා හා සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරය එල්ල කළ නියම ප්‍රහාරකයින්ගේ අනන්‍යතාවත් යටපත් කිරීමට ඔවුන් අදහස් කළ නිසාය.

මෙම පසුබිම ගැන සැළකිලිමත්ව උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට සම්බන්ධව කෙළින්ම කරුණු සළකා බැලීමට අපි අදහස් කරමු.

I. රෝහිත ප්‍රියදර්ශන ශ්‍රී ලංකා පොලිසියේ තරුණ උද්‍යෝගීමත් නිලධාරියෙක් විය. ඔහු අවංක හා නිර්භීත තැනැත්තෙක් විය. ඔහු කැලණිය ප්‍රදේශයේ නිරාකරණය නොකරන ලද අපරාධ පිළිබඳ ප්‍රශ්න විසඳීමට සමත් විය. ඔහුගේ නිල රාජකාරි

ඉටුකිරීමේදී සහ සැකකරුවන් අත්අඩංගුවට ගැනීමේදී ඔහු අපරාධකරුවන්ගේ දේශපාලන සම්බන්ධතා තැකුවේ නැත.

II. සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරය එල්ල කළ අවස්ථාවේදී හා ඔහු ( රෝහිත ප්‍රියදර්ශන) 1990 පෙබරවාරි මස 20 වන දින අතුරුදහන් වන තුරු රෝහිත ප්‍රියදර්ශන අනුයුක්තව සිටියේ සපුගස්කන්ද පොලිස් ස්ථානයටය.

III. සපුගස්කන්ද පොලිස් ස්ථානයට ප්‍රහාරය එල්ලවූ අවස්ථාවේ රෝහිත ප්‍රියදර්ශන අනිකුත් නිලධාරීන්ද සමග රාජකාරි සඳහා පොලිස් ස්ථානයෙන් පිටව ගොස් සිටි අතර, පිපිරීම හා තුවක්කු වෙඩි ශබ්දය ඇසීමෙන් පසු පොලිස් ස්ථානය කරා වහාම පැමිණියේය.

IV. රෝහිත ප්‍රියදර්ශන, සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවූ ප්‍රහාරයට හා ඊට සම්බන්ධ කුමන්ත්‍රණයට කිසි ලෙසකිනුත් සම්බන්ධ බවට සාක්ෂි නැත.

V. 1990 පෙබරවාරි මස මුල හරියේ දිනයකදී රෝහිත ප්‍රියදර්ශන තවත් පොලිස් නිලධාරීන් ඇතැමෙකු සමග බරපතල අපරාධ කිරීමට සම්බන්ධ සැකකරුවකු වූ ටියුඩර් පෙරේරා නැමැත්තෙක් අත්අඩංගුවට ගත්තේය. එකී ටියුඩර් පෙරේරාද ඉහත සඳහන් සුනිල් පෙරේරා නොහොත් ගෝනවල සුනිල්ගේ බෑණා කෙනෙක් විය.

VI. ඉහතින් සඳහන් ටියුඩර් පෙරේරා අත්අඩංගුවට ගැනීමෙන් දින කිහිපයකට පසු එම සැකකරු (ටියුඩර් පෙරේරා) තත්ත්වාකාර පොලිස් භාරයේ සිටියදී අතුරුදහන්විය. නියම වශයෙන්ම කුමන තත්ත්වයන් යටතේ සැකකරු අතුරුදහන් වූයේද යන වග තහවුරු වී නැත. එම සැකකරු අතුරුදහන්වීමෙන් පසු එය ගැන උනන්දුව දැක්වූ හා අපහසුවට පත් පාර්ශවයන් ( ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළුව) විසින් ටියුඩර් පෙරේරා අතුරුදහන්වීම ගැන රෝහිත ප්‍රියදර්ශන වගකිවයුතු බවට චෝදනා එල්ල කරන ලදී.

VII. ටියුඩර් පෙරේරා අත්අඩංගුවට ගෙන ඇති බවට ටියුඩර් පෙරේරාගේ කිට්ටු නෑදෑයෝ රනිල් වික්‍රමසිංහ මහතාට පැමිණිලි කළහ.

VIII. 1990 පෙබරවාරි මස 20 වන දින රාත්‍රී රෝහිත ප්‍රියදර්ශන සපුගස්කන්ද පොලිස් ස්ථානයේ රාජකාරි භාර නිලධාරියා ලෙස ( S.D.O.) කටයුතු කළේය. එසේ කරන ලද්දේ පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධාරියා වූ පොලිස් පරීක්ෂක කීර්ති අතපත්තු බියගම විලේජ් හෝටලයේ පැවති සාකච්ඡාවකට සහභාගීවීමට ගොස් සිටි බැවිනි.

IX. පෙබරවාරි මස 20 වන දින රාත්‍රී 8.00ට පමණ පෙරකී පොලිස් පරීක්ෂක අතපත්තු රෝහිත ප්‍රියදර්ශණට සපුගස්කන්ද පොලිස් ස්ථානයට දුරකථන

පණිවිඩයක් දී ඔහුට බියගම විලේජ් හෝටලයට පැමිණෙන ලෙස උපදෙස් දුන්නේය.

X. ඊට මඳ වේලාවකට පසු රෝහිත ප්‍රියදර්ශන බියගම විලේජ් හෝටලයට යනු පිණිස සපුගස්කන්ද පොලිස් ස්ථානයෙන් පිටත්ව ගියේය. එතැන් පටන් රෝහිත ප්‍රියදර්ශන සපුගස්කන්ද පොලිස් ස්ථානයට හෝ ඔහුගේ නිවසට ආපසු පැමිණියේ නැත.

XI. නැතිවූ රෝහිත ප්‍රියදර්ශන සොයා ගැනීමට හෝ ඔහුට කුමක් වූයේද යන්න සොයාබැලීමට පොලිස් බලධාරීන් විසින් තිසි ප්‍රයත්නයක් දරනු ලැබුවේ නැත.

XII. පෙබරවාරි මස 23 වන දින හෝ ඊට ආසන්න දිනයකදී රෝහිත ප්‍රියදර්ශනගේ සිරුර පැලිය ගොඩ පොලිස් ස්ථානය පිටුපස කැලණි ගඟේ පාවෙමින් තිබී හමුවින.

XIII. රෝහිත ප්‍රියදර්ශනගේ මරණය ගැන විමර්ෂණය කිරීමට තිසි ආකාරවූ ප්‍රයත්නයක් දරනු ලැබුයේ නැත. එහෙත් පොලිස් සේවයේ සිටි ඔහුගේ පෞද්ගලික මිතුරෝ ( අජිත් ජයසිංහ ඇතුළුව) ඔහු සොයා ගැනීමට හා ඔහුගේ මරණයට වගකිවයුත්තේ කවුරුන්ද යන්න සොයා ගැනීමට විරෝදාර ලෙස ප්‍රයත්න දැරුහ.

XIV. රෝහිත ප්‍රියදර්ශන ඝාතනය කරනු ලැබ ඇත්තේය යන්න පිළිගැනීමට කැලණිය ප්‍රදේශයේ පොලිස් බලධාරීහු ප්‍රතික්ෂේප කළහ.

XV. අවශ්‍ය විමර්ෂණ කරනු වෙනුවට අදාල බලධාරීහු රෝහණ ප්‍රියදර්ශන අතුරුදහන්ව ඊට පසුව මරණයට පත්වීම සම්බන්ධ තියම තත්ත්වයන් යටපත් කිරිම අරමුණු කොට කරුණු වසන් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කළහ.

XVI. රෝහිත ප්‍රියදර්ශන " තනතුර අතහැර ගියාසේ සලකන" තිවේදනයක් තිකුත් කිරීම මෙම පියවරවලින් එකකි.

XVII. රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වී ඇත යන කරුණට පොලිස් බලධාරීන් පුළුල් ප්‍රචාරයක් දුන් අතර, ඔහු එසේ අතුරුදහන්වී තිබෙන්නේ සිය කැමැත්තෙන්ම බව අඟවනු ලැබිය. ඔහු එසේ අතුරුදහන්වී තිබෙන්නේ කදුරුවහේනගේ ජිනදාස නමැති සැකකරුවෙකු ( එවකට පොලිස් භාරයේ සිටි ) තමන් වරදට අසු කරන තොරතුරු හෙළි කරනු ඇත යන බියෙන්ය යන්න ඇඟවීමට ඔවුහු තැත් කළහ.

XVIII. කදුරුවහේනගේ ජිනදාස තොහොත් ජිනේ 1989 සිට 1990 දක්වා වන කාලය තුල එක්තරා කාලසීමාවක් කැලණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය භාරයේ සිටි බවට ලබාගැනීමට තිබෙන කරුණු වලින් පැහැදිලිවම පෙන්නුම් කෙරේ.

XIX. වාර්තා කර ගන්නා ලදැයි කියන පාපෝච්චාරණයක ස්වභාවයේවූ ඒතේගේ ප්‍රකාශයක් වාර්තා කර ගැනීමට තුඩු දුන් සිද්ධීන්ගේ අනුපිළිවෙල පිළිබඳ තිල විස්තරය ව්‍යාජ එකකි.

XX. කරන ලද්දේ යයි කියන එකී පාපෝච්චාරණය වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් ලබාගැනීමට තිබෙන කරුණු එම පාපෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද්දකැයි ඔප්පු කිරීමට කිසියේත් ප්‍රමාණවත් වන්නේ නැත.

XXI. පෙරකී ප්‍රකාශයෙහි, සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවූ ප්‍රහාරයට සම්බන්ධ තත්ත්වයන් පිළිබඳව වැදගත් වන අසත්‍යයන් අන්තර්ගත වේ.

XXII. රෝහිත ප්‍රියදර්ශන හා අජිත් ජයසිංහ යන උප පොලිස් පරීක්ෂකයින් කෙළින්ම හෝ අනියමින් කිසිත් නීති විරෝධී හෝ අනිසි ක්‍රියාවකට සම්බන්ධ වූයේ යයි හෝ අදාල යයි හෝ නිගමණයකට බැසීමට විශ්වාසය තැබීම සඳහා පෙරකී ප්‍රකාශය කිසිසේත් වටින්නේ නැත. පෙරකී නිලධාරීන් දෙදෙනා කිසිත් ආකාරයකින් සපුගස්කන්ද පොලිසියට එල්ලවූ ප්‍රහාරයට සම්බන්ධ යයි හෝ එකී පොලිස් ස්ථානයේ බෝම්බයක් තැබීමෙන් හෝ/ සහ වෙඩි ද්‍රව්‍ය ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාකාරියෙකුට දීමෙන් හෝ එකී ක්‍රියාවට ඕනැකමින් හෝ වෙනත් ආකාරයකින් ආධාර හෝ අනුබල දුන්නේ යයි හෝ අපහට නිගමනය කළහැකි විශ්වසනීය කරුණු කිසිවක් නැත. එසේම ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාවලට ආධාර කලේ යයි නිගමනය කිරීමට එබඳු කරුණු ඇත්තේද නැත.

XXIII. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට සම්බන්ධ නිල විස්තරය ව්‍යාජ එකකි. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන, කදුරුවහේනගේ ජීනදාස විසින් තමා වරදට පටලවමින්, විශේෂයෙන්ම සපුගස්කන්ද පොලිස් ස්ථානයට එල්ලවූ ප්‍රහාරය පිළිබඳ වරදට පටලවමින් පොලිසියට සාක්ෂි දෙනු ඇත යන බිය නිසා ඔහු 1990 පෙබරවාරි මස 20 වන දින රාත්‍රියේ පොලිස් සේවයෙන් හදිසියේ බැහැරව ගියේය යන අදහසට කිසිදු පදනමක් නැත.

XXIV. පෙරකී රෝහිත ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීම සිදුකිරීමට සහකාර පොලිස් අධිකාරී කීර්ති අතපත්තුගේ ඍජු සම්බන්ධයක් තිබේ.

XXV. රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමත් සමඟම වූ කාලසීමාවේදී හා එම අතුරුදහන්වීම ගැන මෙම කොමිෂන් සභාව විසින් පරීක්ෂා කර බලනු ලැබූ කාලසීමාවේදී ඊට සම්බන්ධ නිවැරදි සිද්ධීන් යටපත් කිරීමට නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ, සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් සහ සහකාර පොලිස් අධිකාරී කීර්ති අතපත්තු ක්‍රියා කළහ.

XXVI. පෙරකී රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීම සම්බන්ධයෙන් නිසි හා නීත්‍යානුකූල පියවර ගැනීමට නියෝජ්‍ය පොලිස්පති මෙරිල් ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලීත් දෙල්ගොඩ සහ සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් අසමත් වූහ.

XXVII. සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්, රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමට අනියමින් සම්බන්ධය. ඉහත සඳහන් රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වීමෙන් පසු ඔහු සොයා ගැනීමට අවංක පියවර ගත් අජිත් ජයසිංහ ඔහු විසින් පැහැර ගෙන ගොස් රඳවා තැබීමෙන් ප්‍රධාන වශයෙන්ම මේ සඳහා වූ සාක්ෂි ලැබේ. ( ඊළඟ නිර්ණේය විෂය යටතේ මෙම කාරණය ගැන කරුණු සඳහන් කෙරෙනු ඇත.)

(ආ) 1990 පෙබරවාරි මස 24 වන දින හෝ ඊට ආසන්න කාලයේදි පැලියගොඩ පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීමට හා ඊට පසු රඳවා තැබීමට සම්බන්ධ තත්ත්වයන් සහ එකී අත්අඩංගුවට ගැනීමට හා රඳවා තැබීමට කෙලින්ම හෝ අනියමින් වගකිවයුතු පුද්ගලයා හෝ පුද්ගලයින් සහ පෙරකී අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීම හා රඳවා තැබීමට ආධාර හෝ අනුබල දුන් පුද්ගලයින්.

I. 1990 පෙබරවාරි මස 24 දිනට පූර්වයෙන් වූ කාලසීමාවේදි පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ වරදක් වන ක්‍රියාවක් සිදුකර හෝ එබඳු ක්‍රියාවකට සම්බන්ධව සිට නැත. එමනිසා 1990 පෙබරවාරි මස 24 වන දිනට පෙරකී අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීමට යුක්තියක් නොතිබුණු බව මෙම කොමිෂන් සභාවේ අදහසයි.

II. 1990 පෙබරවාරි මස 24 වන දිනට පූර්වයෙන්ම වූ කාලසීමාව තුළදී උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ, උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන හදිසියේ අතුරුදහන්වීමට තුඩු දුන් තත්ත්වයන් සම්බන්ධයෙන් අවංකවම විමර්ශණයන් කිරීමටද, එකී රෝහිත ප්‍රියදර්ශන 1990 පෙබරවාරි මස 20 වන දින අතුරුදහන්වීමෙන් පසු ඔහුට සිදුවූයේ කුමක්ද යන්න ගැන විමර්ෂණයන් කිරීමටද, උනන්දු සහගත හා අවංක ඕනෑකමකින් ක්‍රියා කළේය.

III. ඉහතින් වූ ඡේදයෙහි සඳහන් උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහගේ හැසිරීම නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්. (මෙරිල්) ගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලීත් දෙල්ගොඩ, සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් සහ පොලිස් පරීක්ෂක කීර්ති අතපත්තු ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ විරුද්ධත්වයට භාජනය විය.

IV. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීම ගැන අජිත් ජයසිංහගේ විශ්වාසය වූයේ එය කැළණිය ප්‍රදේශයේ උසස් පොලිස් නිලධාරීන් විසින් හෝ ඔවුන්ගේ උපදෙස් මත හෝ සිදුකරන ලද්දක් බවය. 1990 පෙබරවාරි මස 20 වන දින සිට 24 වන දින දක්වා වූ කාලය තුළ අජිත් ජයසිංහ තමාගේ එම විශ්වාසය කැළණිය ප්‍රදේශයේ පොලිස් නිලධාරීන්ට දැනගන්නට සැළැස්විය.

V. 1990 පෙබරවාරි මස 24 වන දින දෙමටගොඩ දුම්රිය හරස් පාර ආයතනයේදී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ ප්‍රධානත්වයෙන් වූ පොලිස් නිලධාරී කණ්ඩායමක් විසින් උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ පැහැර ගෙන ( මෙය නීති විරෝධී අත්අඩංගුවකට ගැනීමකට සමාන විය.) ඔහු පැලියගොඩ පොලිස් ස්ථානයට ගෙන ගියේය. එකී පැහැරගෙන යෑමට සහභාගිවූ අනිකුත් පොලිස් නිලධාරීන් වූයේ පොලිස් සැරයන් ජයරත්න, පොලිස් සැරයන් ලක්ෂ්මන්, පොලිස් සැරයන් රණතුංග, පොලිස් සැරයන් රත්නායක හා පොලිස් කොස්තාපල් රියැදුරු රංජිත් යන අයය. ඉහත සඳහන් පොලිස් නිලධාරීන්ට අමතරව රාජේන්ද්‍ර නම් සිවිල් පුද්ගලයෙක්ද ඉහත කී පැහැරගෙන යෑමට සහභාගී විය. එම පැහැරගෙන යන අවස්ථාවේදී හෝ ඉන් පසුව අජිත් ජයසිංහ අත්අඩංගුවට ගැනීමට යුක්තියක් නොතිබුණු බව අපගේ ස්ථිර විශ්වාසයයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව යටතේ වූ අජිත් ජයසිංහගේ මූලික අයිතිවාසිකම් සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් විසින් උල්ලංඝනය කරන ලද්දේය.

VI. 1990 පෙබරවාරි මස 24 වන දින සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ උවමනාව පිට උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ පැලියගොඩ පොලිස් ස්ථානයේ පැය කිහිපයක් වැරදි ලෙස සිරකොට ගෙන සිටින ලදී. මෙම කාලසීමාව තුළදී අජිත් ජයසිංහ රඳවා ගෙන සිටීමට යුක්ති සහගත හේතුවක් තිබුණේ නැත.

VII. 1990 පෙබරවාරි මස 24 වන දින සිට ඔක්තෝබර් මස 27 වන දින දක්වා උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ, සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ ඉල්ලීම පිට කිසිත් යුක්ති සහගත හේතුවක් නොමැතිව බියගම පොලිස් ස්ථානයේ සිරකොට තබා ගන්නා ලදී. මෙම වැරදි සහගත ලෙස සිරකර ගෙන සිටි කාලසීමාව පෙරකී අජිත් ජයසිංහ නීති විරෝධී ලෙස රඳවා ගැනීමකට සමාන වන්නේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (13)2 ව්‍යවස්ථාව යටතේ වන ඔහුගේ මූලික අයිතිවාසිකම් සෘජුවම උල්ලංඝනය කරන ලදී.

VIII. ඉහත සඳහන් පරිදි උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගෙන නීති විරෝධීව රඳවා ගෙන සිටීම ගැන සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් කෙළින්ම වගකිවයුතු වේ.

IX. උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ ඉහතකී පරිදි නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටීම ගැන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ, සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ අතියමින් වගකිවයුතු වෙති.

ඉහතින් සඳහන් (අ) සහ (ආ) නිර්ණේය විෂයයන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව පහත සඳහන් අතිරේක තීරණවලට බැස තිබේ. මෙම තීරණ ඉහත සඳහන් නිර්ණේය විෂයයන් දෙකටම සෘජුවම සම්බන්ධය.

I. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශනගේ අතුරුදහන්වීමට කරුණු සැලැස්වීමෙන් පසුව හා උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ නීති විරෝධී ලෙස රඳවා තැබීමට සැලැස්වීමෙන් පසු, පෙරකී නීති විරෝධී ක්‍රියාවන්ට වගකිවයුතු අය

(අ) රෝහිත ප්‍රියදර්ශන ඔහුගේ නිදහස් කැමැත්ත අනුවම අතුරුදහන්වී ඇත්තේය හා
(ආ) අජිත් ජයසිංහ කඩාකප්පල්කාරී ක්‍රියාවන්ට ඔහුගේ ඇති සම්බන්ධය නිසා අත්අඩංගුවට ගෙන රඳවා තබන ලද්දේය

යන හැඟීම දීමට තැත් කලෝය.

මේ අනුව, රෝහිත ප්‍රියදර්ශන අතුරුදහන්වූයේ කුමක් නිසාද යන්න පහදාදීමක් වශයෙනුත් හා අජිත් ජයසිංහ අත්අඩංගුවට ගෙන රඳවා තැබීම යුක්ති සහගත බව දැක්වීමටත් ව්‍යාජ සාක්ෂි ගෙනීමට පෙරකී පුද්ගලයෝ කුමන්ත්‍රණය කළහ.

II. 1990 පෙබරවාරි මස 25 වන දින හෝ ඊට ආසන්න කාලයේදී සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස් විසින් ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ සහ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ ඉල්ලීම පිට කදුරුවෙහේනගේ ජිනදාස නමැති සැකකරුවකුගෙන් ව්‍යාජ පාපෝච්චාරණ ප්‍රකාශයක්සටහන් කර ගන්නා ලදි. ඉහත සඳහන් ජිනදාස ඇත්ත වශයෙන්ම අදාල පාපෝච්චාරණ :ප්‍රකාශයේ සඳහන් වචන කට වචනයෙන් ප්‍රකාශ කරන ලද බව ඔප්පු කරන විශ්වාසදායක සාක්ෂි නැත. මෙම ප්‍රකාශයන් උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන හා උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ ඉහත සඳහන් ජිනදාසට සපුගස්කන්ද පොලීසියට එල්ලවූ ප්‍රහාරය සැලසුම් කිරීමට ආධාර කළේය යන වරදට පටලැවීමට තුඩු දෙන්නේය. ඉහත සඳහන් පාපෝච්චාරණ ප්‍රකාශයෙහි, සපුගස්කන්ද පොලීසියට එල්ලවූ ප්‍රහාරය ගැන පළමු විමර්ෂකයින් විසින් ලබාගන්නා ලද සාක්ෂිවලට පරස්පර විරෝධී වූ කරුණු අන්තර්ගත වන්නේය.

III. ඉහත සඳහන් ජිනදාසගේ පාපෝච්චාරණ ප්‍රකාශයේ වාර්තාව, රෝහිත ප්‍රියදර්ශන සහ අජිත් ජයසිංහ වරදෙහි පටලැවීමට මනාව සැලසුම් කළ උපාය මාර්ගයක් බව පෙන්නුම් කරන ප්‍රමාණවත් පැහැදිලි කරුණු තිබෙන බව කොමිෂන් සභාවේ අදහසය. උප පොලිස් පරීක්ෂක රෝහිත ප්‍රියදර්ශන හා උප පොලිස් පරීක්ෂක අජිත් ජයසිංහ වරදෙහි පටලැවීමට තුඩු දෙන ඉහතකී කරුණු අසත්‍ය කරුණු ලෙසට කොමිෂන් සභාවේ සම්පූර්ණ අවිශ්වාසයට ලක්වන අතර කොමිෂන් සභාව ඒවා ප්‍රතික්ෂේප කරයි.

(ඇ) රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ පුද්ගලයින් රඳවා තබා ගැනීමේ ස්ථානයක් හෝ ස්ථාන පිහිටුවා පවත්වාගැනීම සහ 1988 ජනවාරි මස 01 වන දිනෙන් ආරම්භව 1990 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාවේදී එකී ස්ථානයේ හෝ ස්ථානවල කිසියම් පුද්ගලයෙක් හෝ පුද්ගලයෝ රඳවනු ලැබ සිටියෝද, ඔවුහු

අමානුෂික හා ආත්ම ගෞරවය කෙලෙසන ක්‍රියාවන්ට හෝ කුමන්ත්‍රණයක ප්‍රතිඵලය ලෙසට යම් ලිඛිත නීතියක් යටතේ වරදක් වන සැලකිල්ලකට භාජනය කරන ලද්දෝද යන වග සහ එකී ක්‍රියා සඳහා ඍජුවම හෝ අතියමින් වගකිවයුතු වන පුද්ගලයා හෝ පුද්ගලයෝ.

I. 1986 න් ආරම්භව විවිධ අවධිවලදී රනිල් වික්‍රමසිංහ මහතා ( එම මහතා අදාල කාලසීමාව තුළදී කැබිනට් අමාත්‍යවරයෙක් විය.) රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ අදාල බලධාරීන්ට, එකී සංස්ථාවට අයත් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස කැලණිය පොලිස් කොට්ඨාසයේ පොලිස් නිලධාරීන්ට වෙන්කොට මුදාලන ලෙස නියම කර තිබේ.

II. විශේෂයෙන්ම 1988 ජනවාරි 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා වන කාලසීමාවේදී රනිල් වික්‍රමසිංහ මහතාගේ නියමය පරිදි රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරු වන අශෝක සේනානායක මහතා ඉහත සඳහන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ දළ වශයෙන් නිවාස දහතුනක් (13ක්) පමණ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් මහතාට ( කැලණිය පොලිස් කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරී - මෙහෙයුම්) වෙන්කර මුදාහැර තිබේ. ඉහතකී ඩග්ලස් පීරිස් මහතා ඉහතකී නිවාස භාර ගෙන කැලණිය පොලිස් කොට්ඨාශයේ පොලිස් නිලධාරීන්ට විශේෂයෙන්ම කැලණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ නිලධාරීන්ට වෙන්කර දී තිබේ. පෙරකී සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් රනිල් වික්‍රමසිංහ මහතා මාර්ගයෙන් ඉහතකී නිවාස ඉහතකී පොලිස් නිලධාරීන් සඳහා ලබාගැනීම ගැන වගකිවයුතු වේ.

III. ඉහත සඳහන් නිවාස පොලිස් නිලධාරීන් සඳහා ලබාගැනීමේ කටයුත්ත, සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ කිසිත් අවසරයක් නැතිවත්, පොලිස් දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාවල සඳහන් පිළිගත් පොලිස් දෙපාර්තමේන්තු කාර්ය පරිපාටීන්ට පටහැනිවත් සිදුකර තිබේ. ඒ අනුව පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් ඔහුගේ බලතල මේ සම්බන්ධයෙන් අයුතු ලෙස පාවිච්චි කිරීම ගැන වගකිවයුතු වේ.

IV. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරුට ඉහත සඳහන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස පොලිස් නිලධාරීන්ට මුදාලීමට නියම කිරීමෙන් රනිල් වික්‍රමසිංහ මහතා කර්මාන්ත අමාත්‍යවරයාගේ තත්ත්වයෙන් වූ ඔහුගේ බලතල අයුතු ලෙස පාවිච්චි කර තිබේ.

V. පොලිස් නිලධාරීන් සඳහා බටලන්ද නිවාස ලබා ගන්නා ලද මුල් අවස්ථාවේ සිටම එකී නිවාස පොලිස් දෙපාර්තමේන්තු රෙගුලාසිවලට පටහැනිව හා ඒවා උල්ලංඝනය කරමින් ලබාගන්නා ලද බවත්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ (එවකට සිටි කැලණිය පොලිස් කොට්ඨාශයේ කාර්ය භාර නිලධාරියා) දැන සිටියේය. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ, එකී ව්‍යවස්ථා උල්ලංඝනය කිරීමට විරුද්ධව තිසි පියවර ගැනීමෙන් ඕනෑකමින්ම වැළකී සිටියේය. මේ සම්බන්ධයෙන් අදාල පොලිස් දෙපාර්තමේන්තු රෙගුලාසි -

ක්‍රියාත්මක නොකිරීම ගැනද ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තලිත් දෙල්ගොඩ වගකිවයුතු වේ.

VI. මෙහි පහතින් නම් ලැයිස්තු කොට දක්වා ඇති කැලණිය පොලිස් කොට්ඨාශයේ පොලිස් නිලධාරීන්ට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස පහසුකම් සළසා දෙනු ලැබූ අතර, ඔවුහු එම නිවාස පහසුකම් තමන් සඳහා අදාළ පොලිස් දෙපාර්තමේන්තු රෙගුලාසිවලට පටහැනිව ලබාගෙන තිබෙන බව දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට හේතු සාධක ඇතිව එම නිවාස පහසුකම් පිළිගත්හ.

(අ) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තලිත් දෙල්ගොඩ
(ආ) සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස්
(ඇ) ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ

(ඈ) පොලිස් කොස්තාපල් රණතුංග
(ඉ) පොලිස් සැරයන් රත්නායක
(ඊ) පොලිස් කොස්තාපල් සුනිල් පෙරේරා
(උ) කාන්තා පොලිස් කොස්තාපල් කාන්ති ප්‍රනාන්දු
(ඌ) පොලිස් සැරයන් ලක්ෂ්මන් ඩයස්
(එ) පොලිස් කොස්තාපල් හීන්බණ්ඩා
(ඒ) පොලිස් පරීක්ෂක සුදත් චන්ද්‍රසේකර
(ඔ) ප්‍රධාන පොලිස් පරීක්ෂක ඩබ්ලිව්.මහනායක
(ඕ) සහකාර පොලිස් අධිකාරි එච්.ජී.වික්‍රමසිංහ
(ක) සහකාර පොලිස් අධිකාරි ආර්. ධර්මරත්න
(ග) සහකාර පොලිස් අධිකාරි එච්. චන්ද්‍රදාස
(ජ) පොලිස් පරීක්ෂක එන්.එම්.එස්.බී.තිශ්සංක

( කැලණිය පොලිස් කොට්ඨාශයේ තවත් වෙනත් සමහර පොලිස් නිලධාරීන්ද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ පදිංචි වී සිටි බව විශ්වාස කිරීමට හේතු තිබේ. කෙසේ වුවද ඉහතින් නම් සඳහන් අයට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ලැබුණු බවට පැහැදිලි හා තීරණාත්මක සාක්ෂි තිබේ. )

VII. මහ කොළඹ පොලිස් දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස රාජකාරි භාරගෙන සිටි නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්) ගුණරත්න, කැලණිය පොලිස් කොට්ඨාශයේ පොලිස් නිලධාරීන් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාසවල පදිංචිව සිටින බව දැන සිටියේය. පෙරකී නිවාස ලබාගෙන තිබුණේ පොලිස් දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාවලට පටහැනිව බව දැන සිටියේය; නොඑසේ නම් ඒ බව විශ්වාස කිරීමට ඔහුට සාධාරණ හේතු තිබුණේය. එසේ වුවද මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තලිත් දෙල්ගොඩට සහ සහකාර පොලිස් අධිකාරි ඩග්ලස් පීරිස්ට ලිඛිත උපදෙස් දීමෙන් ඔහු වැළකී සිටියේය. නියෝජ්‍ය පොලිස්පති ගුණරත්නගේ මෙම

අයමත්වීම නිසා ඉහත සඳහන් පොලිස් නිලධාරීන් බටලන්ද නිවාසවල දිගින් දිගටම පදිංචිව සිටීම සිදුවිය.

VIII. පොලිස් නිලධාරීන් විසින් බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස කිසිත් නීති විරෝධී අරමුණක් සඳහා පාවිච්චි කිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීමෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තලීන් දෙල්ගොඩ ඕනෑකමින්ම වැළකී සිටියේය.

IX. 1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලසීමාව තුල බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ යම් යම් නිවාස පුද්ගලයින් නීති විරෝධීව රඳවා ගැනීමට හා ඔවුන්ට වධදීමට පාවිච්චි කර තිබේ. මෙම කාර්යය සඳහා පහත සඳහන් නිවාස පාවිච්චි කර තිබෙන බවට තීරණාත්මක සාක්ෂි තිබේ:

නිවාස පිළිබඳ තත්ත්වය
( නිල වාර්තා පදනම් කොට)

(1) B 2 (අ) 1987 සිට 1989 මැයි දක්වා - හිස්ව තිබිණ.
(ආ) 1989 මැයි සිට 1994 අගෝස්තු මාසය දක්වා රනිල් වික්‍රමසිංහ මහතාගේ කාර්යාලය ලෙස තිබිණ.

(2) B 8 1988 සිට 1991 දක්වා සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ට වෙන් කළ ආරක්ෂක නිලධාරීන් විසින් පාවිච්චි කරන ලදි.

(3) B 34 කොමිෂන් සභාවට අදාළ සම්පූර්ණ කාලය තුලම සපුගස්කන්ද පොලිස් ස්ථානයට දී තිබිණ.

(4) A1/8 කිසිත් එක් විශේෂ පොලිස් නිලධාරියෙකුට වෙන්කර දී නොතිබිණි. එසේ වුවද පොලිස් නිලධාරීන්ට ඊට අනවසරයෙන් ප්‍රවේශය ලැබී තිබුණු බව සංස්ථාවේ ඇවරකරුගේ නිරීක්ෂණයට ලක්වී ඇත.

X. 1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලසීමාව තුල මීට මුලින් වූ ඡේදයෙහි සඳහන් නිවාසවල පුද්ගලයින් නීති විරෝධීව රඳවා තබා වධදීම ගැන මෙහි පහත සඳහන් පොලිස් නිලධාරීහු සෘජුවම වගකිවයුතු වෙති:

1. සහකාර පොලිස් අධිකරි ඩග්ලස් පීරිස්
2. ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ
3. පොලිස් සැරයන් රත්නායක
4. පොලිස් සැරයන් රණතුංග
5. උප පොලිස් පරීක්ෂක දෙල්ගහගොඩ
6. පොලිස් සැරයන් උපාලි ලක්හේවා
7. පොලිස් කොස්තාපල් රියැදුරු රංජිත්
8. පොලිස් කොස්තාපල් ජයවර්ධන
9. පොලිස් කොස්තාපල් හීන්බණ්ඩා
10. පොලිස් සැරයන් කප්පාගොඩ
11. කාන්තා පොලිස් කොස්තාපල් පද්මිනි ප්‍රේමලතා
12. පොලිස් කොස්තාපල් ලක්ෂ්මන්
13. පොලිස් පරීක්ෂක සුනිල් බණ්ඩාර නිශ්ශංක (ඉන්පසු මියගොස් ඇත.)

ඉහත සඳහන් නිලධාරීන් විසින් සිදුකර ඇති නීති විරෝධී ක්‍රියා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 13(1) හා 13(2) යන ව්‍යවස්ථා උල්ලංඝණය කිරීමකට සමාන වේ.

1988 ජනවාරි මස 01 වන දින සිට 1990 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලය තුළ ප්‍රධාන වශයෙන්ම පොලිස් නිලධාරීන් සහභාගීවූ යම් යම් සාකච්ජා බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ පවත්වා තිබේ. මෙම රුස්වීම් පොලිස් දෙපාර්තමේන්තුව විසින් පිළිගන්නා ලද ඒවා නොවූ අතර, ඒවා සංවිධානය කර තිබුණේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ නියමයන් අනුවද නොවේ. මෙම රුස්වීම්වලට පැමිණි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ගෙන් සමහර දෙනෙක් මෙසේය.

(1) නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්) ගුණරත්න
(2) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ
(3) සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්
(4) සහකාර පොලිස් අධිකාරී රාජා ඩයස්

මෙම සාකච්ජා පවත්වනු ලැබුයේ අංක B2 ( රනිල් වික්‍රමසිංහ මහතාට වෙන්කොට තිබුණු ඔහුගේ කාර්යාලය වූ නිවසය) හා අංක A2/2 (රනිල් වික්‍රමසිංහ මහතාගේ සංචාරක බංගලාව ලෙසින් වෙන්කර දී තිබුණු නිවසය) යන නිවාසවලය. එකී සාකච්ජාවල ප්‍රධානත්වය දැරුවේ රනිල් වික්‍රමසිංහ මහතාය. රනිල් වික්‍රමසිංහ මහතාට ( රුස්වීම් කැඳවා තිබුණේ ඔහුය) මෙම රුස්වීම් කැඳවීමට බලයක් නොතිබුණි. රනිල් වික්‍රමසිංහ මහතා මෙම රුස්වීම් කැඳවීමෙන් ඔහුගේ බලතල පැහැදිලිවම අයථා ලෙස පාවිච්චි කර ඇත. තවද, ඉහතින් සඳහන් පොලිස් නිලධාරිහු මෙම රුස්වීම්වලට සහභාගීවීමෙන් අවසර නොලත් කාර්යයකට සහභාගීවූවා වෙති.

XI. ඉහතින් සඳහන් අවසර නොලත් රුස්වීම්වලදී රනිල් වික්‍රමසිංහ මහතා ( රනිල් වික්‍රමසිංහ මහතා එවකට කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයා විය) කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන කටයුතු සම්බන්ධයෙන් පොලීසියේ ක්‍රියා

කලාපයට අදාලව උපදෙස් දී ඇත. වික්‍රමසිංහ මහතාට එබඳු නියමයන් කිරීමට නෛතික බලයක් නොමැති වූ බවත්, ඒ සම්බන්ධයෙන් ද ඔහු තම බලය අයථා ලෙස පාවිච්චි කර ඇති බවත් කොමිෂන් සභාවේ අදහසයි. එසේ උපදෙස් දීමෙන් වික්‍රමසිංහ මහතා නියම වශයෙන්ම පොලිසිය සතු රාජකාරිවලට හා නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා මාර්ගයට මැදිහත්වී ඇත්තේය.

XII. ඉහත සඳහන් බලය තොලන් රුස්වීම්, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවීමේ ස්ථාන හා වධකාගාර පැවැත්වීම සමග බේරිය නොහැකි ලෙසින්ම වෙලී පැටලී තිබේ.

XIII. රනිල් වික්‍රමසිංහ මහතා විසින් රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරුට බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නිවාස වෙන්කර මුදාලන ලෙසට දෙන ලද උපදෙස් වලින් අංක B2, B8, B34 හා A1/8 යන නිවාසවල නීති විරෝධී රැඳවුම් මධ්‍යස්ථාන පිහිටුවීමට පහසුකම් සැලසිණ.

XIV. රනිල් වික්‍රමසිංහ මහතා හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නලින් දෙල්ගොඩ මහතා, බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ B2, B8, B34 හා A1/8 යන නිවාසවල නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පැවැත්වීමට අනියමින් වගකිවයුතු වන්නෝය.

XV. නියෝජ්‍ය පොලිස්පති එම්.එම්.ආර්.(මෙරිල්)ගුණරත්න කලින් ඡේදයෙහි සඳහන් නීති විරෝධී ක්‍රියාව ගැන දැන ගෙන සිටිමින් හෝ එම නීති විරෝධී ක්‍රියාව සිදුවන බව විශ්වාස කිරීමට හේතු තිබියදී එම නීති විරෝධී කටයුත්ත දිගින් දිගට සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සුදුසු, නීත්‍යානුකුල හා අවශ්‍ය පියවර ගැනීමෙන් වැලකුණේය.

XVI. සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක රංජිත් වික්‍රමසිංහ, බටලන්ද යෝජනා ක්‍රමයේ ඉහත සඳහන් නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පැවැත්වීම සම්බන්ධයෙන් සෘජුවම වගකිවයුත්තෝය. (පෙරකී නීති විරෝධී රැඳවුම් ස්ථානවල රඳවා ගනු ලැබ සිටි බොහෝ දෙනා ඊට කලින් කැළණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයට අනුයුක්ත පොලිස් නිලධාරීන් විසින් පැහැරගෙන යන ලද බව සැලකියයුතුය.)

XVII. කැළණිය පොලිස් කොට්ඨාසයේ කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකය, මෙම කොමිෂන් සභාවට අදාල කාලසීමාව තුළදී එහි බොහොමයක් කටයුතු බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ සිට මෙහෙයවන ලදී.

XVIII. කැළණිය කඩාකප්පල්කාරී ක්‍රියා මර්දන ඒකකයේ කටයුතු, එබඳු කටයුතු පැවැත්වීමට බලයක් නොමැති ස්ථාන වූ බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ

නිවාසවල සිට මෙහෙයවන ලද බව එවකට පොලිස්පති අර්නස්ට් පෙරේරා දැන සිටියේය. ඒ බව දැන සිටියද අර්නස්ට් පෙරේරා මහතා ඒ සම්බන්ධයෙන් උචිත හා අවශ්‍ය පියවර ගැනීමෙන් වැළකී සිටියේය.

## සමාප්ති නිරීක්ෂණ සටහන්.

ප්‍රාරම්භක පරිච්ඡේදයෙහි සඳහන් කරන ලද පරිදි 1988 සිට 1990 දක්වාවූ කාලසීමාව ගිඝණ සමයක් විය. ජනතා විමුක්ති පෙරමුණ ( J.V.P.) දරුණු ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකිරීමෙහි යෙදුණු අතර, ඊට එරෙහිව එවකට පැවති රජය ඇතුලත හා පිටත වූ බලවේග විසින් ඒ හා සමානම සාපරාධී ක්‍රියා සිදුකරන ලදී. ජනතා විමුක්ති පෙරමුණට එරෙහිව ක්‍රියා කල රජය පිටත වූ බලවේග (සෝදිසි කණ්ඩායම් වැනි) පොලීසියේ හා සන්නද්ධ හමුදාවල ආශිර්වාදය ඇතිව එසේ කළහ. ඇතැම් අවස්ථාවල එම බලවේග පොලීසිය බඳු රජයේ බලවේග සමග කුමන්ත්‍රණකාරී සම්බන්ධයෙන් යුතුව ක්‍රියා කළහ. රජය කඩාකප්පල්කාරීන් අත්අඩංගුවට ගැනීමට හා ඉවත් කරලීමට උනන්දුව දැක්වූ නමුත්, එම අරමුණු ඉටුකර ගැනීමට උපයෝගී කර ගත්තා ආකාරය ගැන තැකීමක් නොකල බව තීරණය කිරීමට ප්‍රමාණවත් වන කරුණු තිබේ. රජයේ බලවේග විසින් ඔවුන්ට එරෙහිව අනුගමනය කරන ලද උපාය මාර්ග අතරට පැහැර ගෙන යැම හා ඝාතනය කිරීම වැනි අධිකරණ ක්‍රමයෙන් බාහිර ක්‍රියාද ඇතුලත් විය. රජයේ බලවේග විසින් අධිකරණ ක්‍රමයෙන් බාහිර ක්‍රියාවල යෙදීම වැළැක්වීමට ප්‍රමාණවත් පියවර ගැනීමෙන් වැලකිණ. අධිකරණ ක්‍රමයෙන් බාහිර ක්‍රියාවල යෙදෙන බවට චෝදනා ලැබුණු අය රජය විසින් ආරක්ෂා කරනු ලැබිණ. එවකට සිටි රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා යුක්තිය පසිඳලීමේ හා නිතිය ක්‍රියාත්මක කිරීමේ සාමාන්‍ය ක්‍රියාදාමයට මැදිහත්වූ අවස්ථාවක් ගැන එවකට සිටි පොලිස්පතිවරයා සාක්ෂි දුන්නේය. මාධ්‍යවේදී රිචඩ් ද සොයිසා ඝාතනය කිරීමට සම්බන්ධයක් තිබීම නිසා අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබ සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරියෙකු අත්අඩංගුවට නොගැනීමට එකී අමාත්‍යවරයා විසින් පොලීසිය පොලඹවනු ලැබූ බව එවකට සිටි පොලිස්පතිවරයා සාක්ෂිදෙමින් කිය. මෙම කොමිෂන් සභාවට මෙබඳු තවත් අවස්ථාවක් ගැන දැනගන්නට ලැබිණ. නීතිඥ විජේදාස ලියනාරච්චි ඝාතනය කිරීම ගැන ඇටෝර්නි ජනරාල්වරයා විසින් පොලිස් නිලධාරීන් තුන්දෙනෙකුට විරුද්ධව අධි චෝදනා ඉදිරිපත් කරන ලදී. මෙම චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි අධිනීතිඥවරයාගේ ගාස්තු රජය විසින් ගෙවන ලද බවට වන සාක්ෂි කොමිෂන් සභාවට ලැබී තිබේ. එවකට පැවති රජයේ ආකල්පය සමස්තයක් වශයෙන් මෙම සිද්ධීන්ගෙන් පැහැදිලිව පෙන්නුම් කරනු ලැබේ.

ජනතා විමුක්ති පෙරමුණේ හෝ ඊට සම්බන්ධ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය බඳු සංවිධානවල හෝ සාමාජිකයින් විසින් සිදුකරන ලද ත්‍රස්තවාදී ක්‍රියාවලට අප කිසි ලෙසකිනුත් සමාව නොදෙන බව අපි ස්ථිරවම ප්‍රකාශ කරනු කැමැත්තෙමු. ඔවුන් ත්‍රස්තවාදී ක්‍රියාවල යෙදීමට පෙලඹවූ හේතු කුමක් වුවත් දේශපාලන බලය ලබාගැනීම සඳහා 1987 සිට 1990 දක්වා වූ කාලසීමාවෙහි ඔවුන් අනුගමනය කරන ලද ක්‍රමවලට ඇස කණ පියා ගැනීමට අපට නොහැකිය. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචණ්ඩ ක්‍රියාවල ප්‍රතිඵලය ලෙසට දේශපාලනඥයින්, දේශපාලන ක්‍රියාකාරීන්, පොලිස් නිලධාරීන් හා සිවිල් වැසියෝ සිය ගණනක් ජීවිතක්ෂයට පත්වූහ. ප්‍රචණ්ඩ ක්‍රියා රජයේ සංවිධානවල සාමාන්‍ය ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑ අතර, ඇතැම්

අවස්ථාවල එම ක්‍රියා නිසා අත්‍යවශ්‍ය සේවා අඩපණ විය. එහි ප්‍රතිඵලය ලෙසට පොදු මහජනතාවට අති විශාල දුෂ්කරතාවලට මුහුණපෑමට සිදුවිය. එමනිසා මෙයින් පැන නැගුණු තත්ත්වය අති විශේෂ ස්වභාවයේ එකක් විය. එම ගිණුණ ක්‍රියා නිසා අරාජික තත්ත්වයක්ම වාගේ උද්ගත විය.

කෙසේ වුවද, පැවති තත්ත්වය කුමක් වුවත්, වගකීමේ හැඟීමෙන් යුත් රජයක් ඊට ප්‍රතිචාර දැක්විය යුත්තේ නීතියේ ආධිපත්‍යයට අනුකූලවය. ආණ්ඩු කිරීම සිදුවිය යුත්තේ පිළිගත් නීත්‍යානුකූලව වලංගු වන සම්මතයන්ට අනුකූලවය. නීති ක්‍රියාත්මක කිරීම සිදුවිය යුත්තේ අදාල නීතිරීති අනුවය. එහෙයින් ජනතා විමුක්ති පෙරමුණෙන් කෙතරම් ප්‍රකෝප කරනු ලැබීමක් සිදුවුවද, එම ජනතා විමුක්ති පෙරමුණු ක්‍රියාවන්ට ප්‍රතික්‍රියාවක් වශයෙන් එකල රජය විසින් " අධිකරණ ක්‍රමයෙන් බාහිර" ක්‍රියාවන්ට අනුමතිය දී මෙහෙයවීමක් සිදුනොවියයුතු විය. එකල රජය ඇත්ත වශයෙන්ම ජනතා විමුක්ති පෙරමුණෙන් සිදුකරනු ලැබූ ත්‍රස්තවාදී ක්‍රියා රැල්ල පාලනය කිරීම සඳහා අධිකරණ ක්‍රමයෙන් බාහිර ක්‍රම අනුගමනය කර තිබෙන බව අප සැලකිල්ලට ගන්නේ කණගාටුවෙනි. ජනතා විමුක්ති පෙරමුණේ ත්‍රස්තවාදය, රාජ්‍ය ත්‍රස්තවාදයෙන් මෙල්ල කිරීමට තැත් කරන ලදී. එම ක්‍රියාදාමයේදී නියම ත්‍රස්තවාදීන් සමහරක් ඉවත් කරනු ලැබුවා පමණක් නොව වෙනත් කිසිත් නීති විරෝධී ක්‍රියාවකට වගකිවයුතු නොවූ අහිංසක තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවකට එක්කෝ හානි පමුණුවනු ලැබූහ; නොඑසේ නම් ඔවුන් ඝාතනය කරනු ලැබූහ. මෙම කාලසීමාවේදී පාලක පක්ෂයේ දේශපාලනඥයෝ පොලීසියේ කටයුතුවලට ක්‍රියාශීලීව සහභාගීවූහ. ඇතැම් අවස්ථාවල ඔවුහු පොලිසියේ කටයුතු මෙහෙයවූහ. ඉහතින් සඳහන් කාලසීමාවේ සිදුවූ කරුණු පිළිබඳව " බටලන්ද සිද්ධිය" එක් උදාහරණයක් පමණකි.

මෙබඳු අවාසනාවන්ත හා තුච්ඡ ක්‍රියා තවත් කිසි දිනෙක ශ්‍රී ලංකාවේ මින්මතු දක්නට නොලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමු.